TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of Integrity

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

## එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී දිනය සැමරීම උදෙසා පැවැත්වෙන, ජාතික සුපිළිපන් ප්‍රණාම - 2010

## නාමයෝජනා මාර්ගෝපදේශ

### ජාතික සුපිළිපන් ප්‍රණාම

ස්වකීය කටයුතු වලදී අතිවිශිෂ්ට ලෙස ස්වකීය සුපිළිපන්නතාවය රැකෙන අයුරින් කටයුතු කර ඇති පුද්ගලයන් හෝ සංවිධාන වෙත පිරිනැමෙන ජාතික සුපිළිපන් ප්‍රණාමය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය විසින් අඛණ්ඩව වාර්ෂිකව පුදනු ලැබූ අතර මෙය එම ප්‍රණාම මාලාවේ සත්වැන්නයි.

2004 වර්ෂයේදී ප්‍රණාම ප්‍රදානය ඇරඹුණ දා පටන් මේ දක්වා පුද්ගලයින් නව (9) දෙනෙකුට ප්‍රණාම ප්‍රදානය කර ඇති අතර ක්ෂේත්‍රයෙහිලා සුවිශේෂී දායකත්වයක් කර ඇති සිව් දෙකනුට "ජූරියේ විශේෂ සම්මානය" ලබා දී ඇත. ඉහළ පෙළේ රාජ්‍ය නිලධාරීන්, ජනමාධ්‍යවේදීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරිකයින් මෙන්ම සමාජ ක්‍රියාකාරකයන් එම ප්‍රණාමලාභීන් අතර වේ.

පිළිගත් පුද්ගලයින් කිහිපදෙනෙකුගෙන් සැදුම්ලත් ස්වාධීන විනිසුරු මඬුල්ලක් මගින්, තරගකාරී ක්‍රියාවලියක් හරහා ප්‍රණාමලාභීන් තෝරාගනු ලබන අතර විනිසුරු මඬුල්ලේ තීරණය අවසාන තීරණය වේ.

### 01. නාමයෝජනා සඳහා සුදුසුකම් ලබන අය පහත අවශ්‍යතා සපුරාලිය යුතුය.

(i) ශ්‍රී ලංකාවේ පවත්නා දූෂණය අවම කරගැනීමට ක්‍රියාකිරීම හෝ වැළැක්වීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් සුවිශේෂී ප්‍රතිඵල ජනනය කරන ලද ක්‍රියාවක / ක්‍රියාවන් හි නිරත වී ඇති අයෙකු වීම. (දූෂණයේ ස්වරූපය පිළිබඳව දැනගැනීමට අංක 01 ඇමුණුම බලන්න)

(ii) එම ක්‍රියාවන් ජාතික තලයේ හෝ ජාත්‍යන්තර තලයේ ආදර්ශයක් ලෙස පිළිගනු ලබන ක්‍රියාවක් / ක්‍රියාවන් වන්නේ නම් වඩා යෝග්‍ය වේ.

(iii) එම ක්‍රියාව / ක්‍රියාවන් දූෂණය අවම කිරීම උදෙසා පුරෝගාමී, නව්‍ය හා ධෛර්යයවන්ත ක්‍රියාවක් විය යුතුය.

(iv) අදාළ ක්‍රියාව / ක්‍රියාවන්, දූෂණය අවම කරගැනීමට හෝ වැළැක්වීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් දිගු කාලීන බලපෑමක් සහිත ඒවා විය යුතුය.

(v) ජීවත්ව නොසිටින පුද්ගලයෙකු සම්බන්ධයෙන් වුවද නාමයෝජනා ඉදිරිපත් කළ හැකිය.

## 02. නාමයෝජනා සඳහා නුසුදුසු අය

මතු සඳහන් පුද්ගලයෝ / සංවිධාන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ජාතික සුපිළිපන්න ප්‍රණාම සඳහා සුදුසුකම් නොලබති.

(i) ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ඇගයුම් හා ප්‍රතිපත්තීන්ට පටහැනිව කටයුතු කරනු ලැබ ඇති පුද්ගලයින් / සංවිධාන (කරුණාකර ඇමුණුම 2 බලන්න)

(ii) ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, සුපිළිපන්න ප්‍රණාම කමිටුවේ සාමාජිකයන් හා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ වැටුප් ලබන කාර්ය මණ්ඩල සාමාජිකයින් (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විවිධ ක්‍රියාකාරකම්වලට සම්බන්ධව සිටි පුද්ගලයින්ගේ නම් ජාතික සුපිළිපන් ප්‍රණාම සඳහා නාම යෝජනා කිරීමට බාධාවක් නොමැත.)

## 03. නාමයෝජනා ඉදිරිපත් කිරීමේ පිළිවෙළ

(i) සෑම නාමයෝජනාවක්ම යම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් විසින් මෙම මාර්ගෝපදේශ ප්‍රකාර ඉදිරිපත් කළ යුතුය. කිසිවකුට තමා විසින් තමාවම නාමයෝජනා කිරීම කළ නොහැක.

(ii) සම්මාන ප්‍රදාන කමිටුවේ සාමාජිකයින්ට හෝ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ කාර්ය මණ්ඩලයට නාම යෝජනා ඉදිරිපත් කිරීම කළ නොහැකිය. (අයදුම්කරුවන්ට අයදුම්පත් සකස් කරගැනීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ සහාය අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා කාර්ය මණ්ඩලයේ සහාය පැතිය හැකිය.)

## 04. නාමයෝජනා පත්‍රය

නිවැරදි හා සම්පූර්ණ නාමයෝජනා පත්‍රයක අන්තර්ගතය මතු සඳහන් පරිදි විය යුතුය.

(i) නාමයෝජනාවට ලක්වන පුද්ගලයා පිළිබඳ පූර්ණ ජීව දත්ත විස්තරයක් හා පුද්ගලික තොරතුරු පිළිබඳ කෙටි සටහනක්

(ii) නාමයෝජනාවක් ඉදිරිපත් කරන ලිපියක් හා නාමයෝජනාව ඉදිරිපත් කරන්නා විසින් අදාල යෝජිත පුද්ගලයා / සංවිධානය සම්මානයට පාත්‍ර වියයුතු වන්නේ කුමන හේතු සාධක මතද යන්න සඳහන් කරන ලද වචන 250 කට නොවැඩි විස්තරයක්

(iii) නාමයෝජනාවට ලක්වන පුද්ගලයා විසින් ස්වකීය කැමැත්ත ප්‍රකාශ කරන පත්‍රිකාව (කරුණාකර ඇමුණුම 3 බලන්න) නිසි පරිදි පුරවා අත්සන් කර තිබිය යුතුය.

- නාමයෝජනාවට ලක්වන පුද්ගලයා මියගොස් සිටීනම්, පවුලේ ආසන්නතම ඥාතියෙකුට හෝ එවැනි පුද්ගලයෙකු නොමැති විටකදී වෙනත් ඥාතියෙකුටද කැමැත්ත ලබාදිය හැකිය.

(iv) නාමයෝජනාවට ලක්වන පුද්ගලයා විසින් සුපිළිපන්න ප්‍රතිඥාවට අත්සන් කළ යුතුය. (කරුණාකර ඇමුණුම 4 බලන්න)

*අසම්පූර්ණ නාමයෝජනා පත්‍ර, සම්මාන ප්‍රදානය සඳහා සලකා බලනු නොලැබේ.*

## 05. නාමයෝජනා ඉදිරිපත් කිරීම.

නාමයෝජනා භාරගන්නා අවසාන දිනය - 2010 අගෝස්තු 31

ඔබ නාමයෝජනාවක් ඉදිරිපත් කරන්නේ නම් මෙහි අමුණා ඇති නාමයෝජනා පත්‍රය නිවැරදිව සම්පූර්ණකර තැපැල් / විද්‍යුත් තැපැල් මගින් 2010 අගෝස්තු 31 දිනට ප්‍රථම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා වෙත එවීමට සලස්වන්න. නාමයෝජනා පත්‍රය මෙම ලේඛනය අවසානයේ අමුණා ඇති ආකෘති පත්‍රය ප්‍රකාර සකස් කළ යුතුය. (කරුණාකර ඇමුණුම අංක 5 බලන්න.)

ජාතික සුපිළිපන් ප්‍රණාම - 2010
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
නො. 28/1, බුලර්ස් පටුමග
කොළඹ 07.

දු.ක. අංක - 011-5627432
ෆැක්ස් - 0112592287
විද්‍යුත් තැපෑල - nia@tisrilanka.org

***ප්‍රමාද වී ලැබෙන නාමයෝජනා සම්මාන ප්‍රදනය සඳහා සලකා බලනු නොලැබේ.***

## 06. සම්මාන ප්‍රදන කමිටුව

i. සමාජයේ ඉහළ පිළිගැනීමක් සහිත, සුපිළිපන්නතාවයෙන් පිරිපුන් අයවලුන් තිදෙනෙකුට නොඅඩු පිරිසකගෙන් සමන්විත කමිටුවක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් 'සම්මාන ප්‍රදන කමිටුව' ලෙස පත්කරගනු ලැබේ. ඉන් අනතුරුව කමිටුව විසින් සභාපතිවරයෙකු හෝ සම සභාපතිවරු පත්කරගැනීම කරනු ලැබේ.

ii. සම්මාන සඳහා තේරීමේ ක්‍රියා පටිපාටිය තුළදී කමිටුව විසින් උපරිම ආකාරයේ සුපිළිපන්න ප්‍රමිතීන් අනුගමනය කරනු ලැබේ.

iii. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ සහ කාර්යමණ්ඩලය විසින් නාමයෝජනා කැඳවීමේ කටයුතු වලදී කමිටුවට සහාය ලබාදෙන අතර යම් නාමයෝජනාවක් පිළිබඳ කරුණු තහවුරු කරගැනීම පිණිස වැඩිදුර තොරතුරු ලබාගැනීමට අවශ්‍ය වූ විටෙක කමිටුව විසින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ සහය ලබාගනු ඇත.

iv. සම්මාන ප්‍රදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ. එනමුත්, ඉදිරි වර්ෂයක් සඳහා පත් කරනු ලබන කමිටුවක් මෙම උපදේශ මාලාවේ 8 වෙනි මාර්ගෝපදේශය ප්‍රකාරය ලබා දී ඇති සම්මානයක් ආපසු ලබා ගැනීම පිළිබඳ සලකා බැලීමක් කළ හැකිය.

## 07. සම්මාන ප්‍රදන කමිටුවේ හිමිකම් හා බලතල

සම්මාන ප්‍රදන කමිටුවට පහත කරුණු සම්බන්ධයෙන් පූර්ණ හිමිකම් සතුය.

1. නාමයෝජනා කැඳවීමට පෙර, පවත්නා නාමයෝජනා මාර්ගෝපදේශ සමාලෝචනය කොට වෙනස්කම් කිරීමට.

2. බලපවත්නා මාර්ගෝපදේශ අනුගමනය කිරීම හා නාමයෝජනා ඇගයීමේ ක්‍රියාපටිපාටිය තීරණය කිරීමට.

3. බැඳියාවන් අතර ගැටුම් සහගත තත්ත්වයක් (Conflict of interest) උද්ගත වී ඇති විටෙක කමිටුවේ සාමාජිකයෙකුට / සාමාජිකයින්ට යම් නාම යෝජනාවක් පිළිබඳ ඡන්දය දීමෙන් කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමට හැකිය.

4. යම් නාමයෝජනා පත්‍රයක් සඳහා අමතර තොරතුරු ලබාදෙන ලෙස නාමයෝජකගෙන් ඉල්ලා සිටීමටත්, සුදුසු යැයි හැඟෙන විමර්ශනයන්හි යෙදීමටත් හා සපයා ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන බව පෙනීයන විටකදී එම නාමයෝජනා නොසලකා හැරීමට.

5. නාමයෝජනාවට ලක්වී ඇති පුද්ගලයා / සංවිධානය, පදිංචි හෝ පිහිටි ප්‍රදේශයට හෝ ස්ථානයට ගොස් යම් තොරතුරක නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට හෝ වැඩිදුර තොරතුරු ලබාගැනීමට.

6. අවසාන වටයට තෝරාගත් නාමයෝජනා ලැයිස්තුව ප්‍රසිද්ධියට පත් කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීමට.

7. ඉතාමත් සුදුසුම නාමයෝජනාව (පුද්ගලයන් / සංවිධාන 2 නොවැඩි) තෝරාගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීමට.

8. නියමිත ප්‍රමිතීන්ට ගැලපෙන නාමයෝජනා ඉදිරිපත් වී නොමැති විටකදී සම්මාන ප්‍රදනය කිරීමෙන් වැළැකීමට.

9. සම්මාන ප්‍රදන දෙකකට අමතරව ජූරියේ විශේෂ සම්මානයක් ලබාදීමට.

10. මතු සඳහන් මාර්ගෝපදේශ අංක 8 ප්‍රකාරව, සම්මානයක් ආපසු ලබාගැනීමට.

## 08. ප්‍රදානය කළ සම්මානයක් ආපසු ලබාගැනීම

8.1 මීට පෙරදී පිළිගැන්වූ සම්මානයක් ආපසු ලබාගැනීම සම්බන්ධයෙන් සම්මාන ප්‍රදාන කමිටුවට කටයුතු කළ හැකිය. ඒ සඳහා පහත සඳහන් කොන්දේසි මත පිහිටා ක්‍රියා කළ යුතුය.

i යම් හෙයකින් පූර්ව සම්මානලාභියාගේ නාමයෝජනාවේ අසත්‍ය හෝ විකෘති කරන ලද තොරතුරු තහවුරු වූ අවස්ථාවක

හෝ

ii සම්මානලාභියා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ දැක්ම සහ මෙහෙවරට පටහැනි ලෙස කටයුතු කරයි නම්

8.2 මේ සඳහා සම්මාන ප්‍රදාන කමිටුව තීරණ ගැනීමට පෙර අදාළ සියලු තොරතුරු රැස් කර අදාළ සම්මානලාභියාට ද කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීම කළ යුතුය.

8.3 ඉහත කරුණුවල සඳහන් පරිදි ප්‍රදානය කළ සම්මානයක් අවලංගු කිරීම සඳහා සම්මාන ප්‍රදාන කමිටුව වෙත ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂක විසින් ආයාචනයක් ඉදිරිපත් කළ යුතුවේ. සම්මාන ප්‍රදාන කමිටුව විසින් ඔවුන්ගේ තීරණය සම්බන්ධයෙන් නිසි හේතු දැක්වීමක් කළ යුතුය. කෙසේ වෙතත් සම්මාන ප්‍රදාන කමිටුවට කිසිදු හේතු දැක්වීමකින් තොරව සම්මානයක් අවලංගු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ආයාචනය ඉවත දැමීමට ද හැකිය.

## 09. ප්‍රතිඵල දැනුම් දීම

2010 දෙසැම්බර් මස 09 දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) හෝ පසුව තීරණය කරනු ලබන වෙනත් ස්ථානයකදී පැවැත්වෙන අන්තර්ජාතික දූෂණ විරෝධී දින උත්සවයේදී සම්මාන ප්‍රදනය කරනු ලැබේ. පෙර ප්‍රදානය කරන ලද සම්මානයක් අවලංගු කිරීමක් කරන අවස්ථාවක් වෙතොත් එයද මේ අවස්ථාවේදී දැනුම් දෙනු ලැබේ. පූර්ව සූදානම්වීමේ කටයුතු සඳහා කාලය අවශ්‍ය වන හෙයින් අවම වශයෙන් දෙසැම්බර් 09 දිනට සති 03 කට පෙරවත් තෝරාගත් සම්මානලාභීන් පිළිබඳව TISL වෙත දැනුම්දීම කළ යුතුය.

ඇමුණුම 1
'අ' කොටස

# දූෂණයේ විවිධ පැතිකඩයන්

දූෂණය සම්බන්ධයෙන් මුළු ලෝකයම පිළිගත් තනි නිර්වචනයක් ඉදිරිපත් කිරීම උගහටය. "දූෂණය" නමැති වදන සම්බන්ධයෙන් විවිධ අර්ථ පවතින අතර විවිධාකාරයෙන් නිර්වචනය කරනු ලැබේ.

ලොව පුරා බහුල වශයෙන් පිළිගත් කාර්ය බද්ධ නිර්වචනය ලෙසින් පිළිගැනෙන්නේ "**පැවරී ඇති බලතල අයුතු ලෙස භාවිතය දූෂණය වේ**" යන්නයි.

<u>**දූෂණය සිදුවන්නේ කුමන මට්ටම් වලදීද**</u>

## මහා පරිමාණ හා සුළු පරිමාණ දූෂණ :

රටක පවත්නා මහා පරිමාන දූෂණයන් හේතුවෙන්, එරට මහජනතාව යහපාලනය, නීතියේ ආධිපත්‍යය මෙන්ම ආර්ථික ස්ථායීතාවය කෙරෙහි දක්වන විශ්වසනීයත්වය පුළුල් වශයෙන් පරිහානියකට ලක් කරයි.

ප්‍රමාණාත්මකව සුළු වශයෙන් සැලකිය හැකි මුදල් ප්‍රමාණයක් හුවමාරු වෙන, ස්වකීය කැමැත්ත මත පදනම්ව මූල්‍ය වාසි සලසාදීම, හිත මිතුරන්ට හෝ ඥාතීන්ට  කණිෂ්ඨ මට්ටමේ රැකියා ලබාදීම ආදිය සුළු පරිමාණ දූෂණයන්ට ඇතුළත් වේ.

මහා පරිමාණ දූෂණයන්, සුළු පරිමාණ දූෂණයන් අතර පවත්නා අතිශය වැදගත් වෙනස්කම වන්නේ

මහා පරිමාණ දූෂණය මගින්, රාජ්‍යයක මධ්‍යගත ක්‍රියාවලිය දූෂණයට ලක් කිරීමත් එහි ක්‍රමවත් ස්වභාවය විකෘති කිරීමත් සිදුවෙන අතර සුළු පරිමාණ දූෂණයන් පවත්නා සමාජ රාමුව තුළ ස්ථාපිතව ඇති පද්ධතීන් තුළම වර්ධනය වී ක්‍රියාත්මකවීම මෙකී සංකල්ප දෙක අතර පවත්නා ප්‍රධානතම වෙනස්කම වේ.

## දූෂණයේ ප්‍රභේද

**අල්ලස :**

යම් ක්‍රියාවක් හෝ තීරණයක් කෙරෙහි අයථා බලපෑමක් කිරීම සඳහා යම් වාසියක් සැලසීම අල්ලස වේ. අල්ලසක් ලබාගැනීමේ ක්‍රියාවලිය එය ලබාගැනනීමට අපේක්ෂා කරන පුද්ගලයා විසින් මෙන්ම අල්ලසක් ලබාදීමට අපේක්ෂා කරන පුද්ගලයා විසින් ද ක්‍රියාත්මක කළ හැකිය.

අල්ලස යනු දූෂණය සම්බන්ධයෙන් පවත්නා ඉතාමත් සුලබ ස්වරූපයයි. අල්ලස් මගින් ලබන්නා වූ වාසිදායක තත්ත්වය මුදල් හෝ වෙනත් වටිනා දෙයක්, සමාගම් කොටස්, අභ්‍යන්තර තොරතුරු, යම් ආකාරයක බලපෑමක්, විනෝදයක්, රැකියාවක් හෝ යම් දෙයක් ලබාදීමට පොරොන්දුවක් ලබාදීම විය හැකිය.

**වංචාව :**

මුදල්, දේපළ හෝ වෙනත් වටිනා භාණ්ඩ ස්වකීය රැකියාවේ හෝ තනතුරේ තමන්ට හිමි නැති, නමුත් ස්වකීය රැකියාවේ හෝ තනතුරේ තත්ත්වය මත ලැබෙන වරප්‍රසාද හේතුවෙන් ප්‍රවේශය ඇති මුදල් දේපළ හෝ වටිනා ද්‍රව්‍ය පුද්ගලික ප්‍රයෝජනයට යොදාගැනීම.

අසත්‍ය හෝ නොමගයවන සුළු තොරතුරු භාවිත කොට යම් දේපළක් එහි හිමිකරු විසින් අත්හැර දැමීමට පෙළඹවීම.

**බලෙන් ලබාගැනීම :**

අල්ලසකදී මුදල් හෝ වෙනත් ආකාරයක දිරිගන්වන සුළු යමක් හුවමාරු වන අතර බලෙන් ලබා ගැනීමේදී එම හුවමාරුව සිදුවන්නේ බලහත්කාරය හෝ තර්ජනයක් යොදාගැනීම මගිනි. එමෙන්ම යම් පුද්ගලයෙකුට නරක අයුරින් බලපාන ඔහු /ඇය පිළිබඳ තොරතුරක් හෙළිදරව් කරන බවට තර්ජනය කොට සහයෝගය ලබාගැනීම ද බලෙන් ලබාගැනීම යටතට අයත් වේ. දූෂණයේ අනෙකුත් ප්‍රභේදයන් මෙන්ම මෙහිදීද මහජන යහපත හෝ තනි පුද්ගලයන් මෙසේ ගනු ලබන දූෂිත තීන්දුවල හෝ දූෂිත ක්‍රියාකාරකම්වල වින්දිතයින් විය හැකිය.

**අභිමතය අයුතු ලෙස භාවිත කිරීම :**

ස්වකීය අභිමතය පුද්ගලික ලාභ ප්‍රයෝජනය සඳහා භාවිත කිරීම ද දූෂණ ක්‍රියාවකි.

උදා: රාජ්‍ය ආයතනයක මිලදී ගැනීම් කටයුතුවලදී නිලධාරියෙකු පුද්ගලිකව තමාට සබඳතාවයක් ඇති, ආයතනයකින් භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කිරීම.

තමාට ලාභ ප්‍රයෝජන ලැබීමට ඉඩ ප්‍රස්ථාවක් පවතින විට දේපළ ඉඩ කඩම් සංවර්ධනය පිළිබඳ තීන්දු තීරණ ගැනීම.

**ඥාති / හිත මිතුරු සංග්‍රහය**

මෙම ප්‍රභේදය තුළ ද අභිමතය අයුතු ලෙසින් පරිහරණය කිරීම පොදු ලක්ෂණයකි. මෙම තත්ත්වයේදී ස්වකීය අභිමතය අයුතු ලෙස භාවිත කරන්නේ තමාට පවත්නා අභිලාෂයක් හේතුවෙන් නොව තමාට සම්බන්ධතාවක් ඇති (පවුලේ, දේශපාලන පක්ෂයේ, ජනවර්ගයේ, ආගමේ, තම කණ්ඩායමේ) අයෙකුගේ අභිලාෂයන් ඉටු කිරීමටය.

මූලාශ්‍රය:
***Abridged version – United Nations Office on Drugs and Crime, The Global Program against Corruption, UN Anti-Corruption Tool Kit, Third Edition, Vienna, September 2004. "Combating Corruption" A Training Manual.***

ඇමුණුම 1
'ආ' කොටස

## මෙතෙක් ප්‍රණාම ලැබූවන් කිහිදෙනෙක්

**තුසිත පිටිගල මහතා**

සිරස මාධ්‍ය ජාලයේ 'විමර්ශන' ගවේෂණාත්මක වැඩ සටහනේ නිෂ්පාදක තුසිත පිටිගල මහතා මහා පරිමාණයෙන් සිදුකෙරෙන දූෂණ නොබියව ඉදිරිපත් කරමින් කළ සේවය කාගේත් පැසසුමට ලක්විය. නීතිය වැරදි ලෙස යොදගැනීම්, ප්‍රධානීන් සිදුකරන අක්‍රමිකතා, දේශපාලන බලපෑම් උඩ කෙරෙන අනිසි ක්‍රියා ආදිය ඔහු විසින් හෙළිකෙරුණි. පසු විපරම් කරමින් දූෂණ රැසක් වළකාලීමටත් ඒවා කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමුකිරීමටත් ඔහු සමත්විය. ශ්‍රී ලංකා ලේ බැංකුව කල්ඉක්මවූ ප්ලස්මා පෙරණ කට්ටල් පාවිච්චි කිරීම පිළිබඳව කෙරුණු හෙළිදරව්ව රට තුළ මහත් ආන්දෝලනයක් ඇතිකරලු අතර අදල නිලධාරීන්ට විරුද්ධව ක්‍රියා කිරීමට රජය පෙළඹුනේ ඔහුගේ මූලිකත්වයෙන් කෙරුණු ගවේෂණ නිසාවෙනි.

**එස්.කේ. ලියනගේ මහතා**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වැනි පන්තියේ නිලධාරියකු වන එස්.කේ.ලියනගේ මහතා තිස් වසරකට වැඩි කාලයක් තිස්සේ කීර්තිමත් නාමයක් හිමිකරගත් රජයේ නිලධාරියෙකි. ජ්‍යෂ්ඨ නිලධාරියෙකුව සිටියදී ජනාධිපති ලේකම්වරයාගේ අත්තනෝමතික තීරණ අභියෝගයට ලක්කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගිය ඔහු එම වැරදි තීන්දු අධිකරණය හරහා නිවැරදි කර ගැනීමට සමත්විය.

**එස්.සී. මායාදුන්නේ මහතා**

විගණකාධිපතිවරයකු ලෙස සේවය කළ සරත් චන්ද්‍රසිරි මායාදුන්නේ මහතා රාජ්‍ය විගණනය ශක්තිමත් කර මහජනතාවට දැනෙන ආකාරයට ප්‍රතිසංවිධානය කළේය. නව ජාතික විගණන පනතක් හඳුන්වා දුන් හෙතෙම සුනාමි කාර්යසාධනය පිළිබඳ අතුරු වාර්තාවක් සහ රුපියල් බිලියන 3.6 ක වැට් බදු වංචාව ගැන තොරතුරු පාර්ලිමේන්තු වෙත ඉදිරිපත් කෙළේය.

**උපනන්ද සේනාරත්න මහතා**

කිරුම් මිනුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ උපනන්ද සේනාරත්න මහතා පටු දේශපාලන වාසි මත කිරුම් මිනුම් රසායනාගාරය වෙනත් ස්ථානයකට ගෙනයෑමට විරුද්ධව දැඩි සටනක යෙදුණේ මරණීය තර්ජන පවා නොතකාය. ශ්‍රේෂ්ඨාධිකරණය හමුවට යෑමෙන් පසු තමන්ට පක්ෂව තීන්දුවක් ලබාගත්තද ඔහු සිය පදවියෙන් ඉවත්කෙරුණි. ඊට එරෙහිව නඩු මගට පිවිස සෙසු රාජ්‍ය නිලධාරීන්ටද ආදර්ශයක් සපයමින් අධිකරණ තීන්දුවක් හරහා යළි සිය පදවියට පත්ව විශ්‍රාම යනතෙක්ම රැඳී සිටියේය.

**ලලිත් අඹන්වල මහතා**

විගණන අධිකාරී ලලිත් අඹන්වල මහතා තමාට එල්ලවූ මරණ තර්ජන නොසලකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිදුවූ රුපියල් මිලියන 40 කට වැඩි වංචාවක් හෙළිදරව් කෙළේය. ඔහු වෙත එල්ලවූ දරුණු ඇසිඩ් ප්‍රහාරයක් හේතුවෙන් එක් ඇසක සදහටම අන්ධ විය. ඒ සිද්ධිය මුල්කරගෙන රට පුරා සියලුම විගණකවරුන්ගේ වර්ජනයක් දියත් කෙරුණි.

ඇමුණුම 2

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ඇගයුම් සහ ප්‍රතිපත්තීන්

### ඇගයුම්

- විනිවිදභාවය (Transparency)
- වගවීම (Accountability)
- සුපිළිපන්නතාවය (Integrity)
- ප්‍රජාතන්ත්‍රවාදය (Democracy)
- සහෝදරත්වය (Solidarity)
- යුක්තිය සහ සාධාරණත්වය (Justice and Equity)
- අපක්ෂපාතීත්වය (Non Partisanship)
- ධෛර්යය සහ දරා ගැනීමේ ශක්තිය (Courage and Endurance)

### ප්‍රතිපත්තීන්

- සවිබලගැන්වීම (Empowerment)
- දැනුම පෙරටු කරගත් ක්‍රියාකාරීත්වය (Knowledge - Led Activism)
- සියලු දෙනාම ඇතුලත් බව සහ සහභාගීත්වය (Inclusion and Participation)
- ප්‍රගතිශීලී සුපරික්ෂාකාරීත්වය (Proactive Vigilance)
- සාධාරණ ක්‍රියාකාරීත්වය (Fair Play)
- අසමාන ලෙස නොසැලකීම (Non Discrimination)
- යහපරිචයන් පිළිගැනීම සහ ප්‍රවර්ධනය (Recognizing and Promoting Best Practices)
- ප්‍රමිති නිර්මාණය (Set Standards)

ඇමුණුම 3

දිනයඃ

ජාතික සුපිළිපන් ප්‍රණාම කමිටුව
ජාතික සුපිළිපන් ප්‍රණාමය 2010
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
28/1, බුලර්ස් පටුමග,
කොළඹ 7.

සම්මාන කමිටුවේ සාමාජිකයින් වෙත,

## කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා මගින් පවත්වනු ලබන 2010 ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙලේ ප්‍රණාමයක් සඳහා මා/අප නාමයෝජනා කරනු ලැබ ඇති බවත් ඒ සම්බන්ධයෙන් මාගේ/අපගේ කැමැත්ත මෙයින් ප්‍රකාශ කරන බවත් මෙයින් සනාථ කර සිටිමි/මු.

මාගේ/අපගේ නාමයෝජනාව අවසාන වටයට තෝරාගනු ලදොත්, එය ඒ පිළිබඳව ප්‍රසිද්ධ කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා හි සුපිළිපන් ප්‍රණාම කමිටුවට මෙයින් බලය පවරා සිටිමි/මු.

මාගේ/අපගේ නාමයෝජනාවේ සඳහන් කරුණු පිළිබඳව පුද්ගලිකව සොයා බැලීමට, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට මෙමගින් බලය පවරා සිටිමි/මු.

නාමයෝජනාවක් ඉදිරිපත් කිරීමත් සමගම, නාමයෝජනාව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ දේපළක් බවට පත්වෙන බවත්, නාමයෝජිතයාගේ කටහඬ හා ඡායාරූප කිසිදු ගෙවීමකින් තොරව ජාතික සුපිළිපන් ප්‍රණාම ප්‍රදානයට අදාළ දැන්වීම් හා ප්‍රසිද්ධ කිරීම්වලට යොදාගැනීමේ පූර්ණ අයිතිය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සතු බවත්, සම්මාන ප්‍රණාම ප්‍රදාන උළෙලේදී මෙන්ම දේශීය හා ජාත්‍යන්තර තලයන්හිදී ඕනෑම මාධ්‍යයකින් එය ඉදිරිපත් කිරීමට ඇති හිමිකමක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා වෙත පවතින බවත් මම/අපි පිළිගනිමි/මු.

නාමයෝජිතයෙකු වශයෙන් ඉහත කරුණට අදාළ නොවන වෙනත් කිසිදු කටයුත්තකට මාගේ/අපගේ දැනුවත් භාවයකින් හා ලිඛිත කැමැත්ත ප්‍රකාශ කිරීමකින් තොරව මාගේ/අපගේ පුද්ගලික දත්ත එක් රැස් කිරීමට හෝ එක්රැස් කොට තබාගැනීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා වෙත මෙයින් බලය නොපවරමි/මු. ජාතික සුපිළිපන් ප්‍රණාම කමිටුවේ නාම යෝජනා ඇගයුම් කටයුතුවලට අදාළ කරුණු සඳහා පමණක් මාගේ/අපගේ පුද්ගලික තොරතුරු භාවිත කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා වෙත බලය පවරමි/මු.

ජාතික සුපිළිපන් ප්‍රණාම නාමයෝජනා ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශ මාලාව ප්‍රකාර සුපිළිපන්න ප්‍රතිඥාව අනුව දිවුරුම් දීමටත් සෑම අවස්ථාවකදීම ඉහළම ආකාරයෙන් සුපිළිපන්නතාවයේ ඇගයුම් ප්‍රතිෂ්ඨාපනය කිරීමටත් වගකීමෙන් බැඳී සිටිමි/මු.

මෙයට විශ්වාසී,

...................................................

නම :

දිනයඃ

## Transparency International Sri Lanka
## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
## ட்ரான்ஸ்பேரன்ஸி இன்டர்நஷனல் ஸ்ரீலங்கா

Integrity Pledge

I,

……………......………..,
with great determination
pledge to live and serve
as an honourable and incorruptible
Sri Lankan
with a deep sense
of accountability, responsibility and
transparency
in my personal, professional and
occupational life
with the noble purpose of passing on
to future generations
a nation ennobled by Integrity,
dedicating myself as a pioneer in
upholding democratic values,
human rights and duties
unsullied by forces that
impede human and national progress

**සුපිළිපන්න ප්‍රතිඥාව**

සුපිළිපන් දේශයක්
මතු පරපුරට දයාද කිරීමේ
උතුම් පරමාර්ථයෙන්
ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ද
මිනිස් අයිතිවාසිකම් හා යුතුකම් ද
සුරැකීම වෙනුවෙන්
පුරෝගාමීව කැපවෙමින්
මනුෂ්‍යත්වයට හා රටේ ප්‍රගමනයට
අහිතකර කවර බලවේගයක් අභිමුව වුව
අකම්පිතව
පෞද්ගලික හා වෘත්තීය ජීවිතයේදී
මනා විනිවිද භාවයකින් ද
වගවීමට හා වගකීමට කැප වූ
දෘෂ්ටියකින් ද යුත්
දූසැරියෙන් තොර හරසැරි
ශ්‍රී ලාංකේය පුරවැසියෙකු සේ
අභිමානවත් ලෙස
ජීවත්වන බවට හා සේවය කරන බවට
.......................................................... වන මම
දැඩි අධිෂ්ඨානයකින් යුක්තව
ප්‍රතිඥා දෙමි.

நேர்மைத்திறன் சத்தியப் பிரமாணம்
நான்
..............................................................
நேர்மைத்திறன் மிகு தேசமொன்றை
நாளைய சந்ததிக்கு உரித்தாக்கும் உயரிய
நோக்குடன் ஜனநாயக ரீதியான
பெறுமானங்களையும் உரிமைகளையும்
கடப்பாடுகளையும் பாதுகாப்பதற்கு
முன்னோடியாக
விளங்கி அர்ப்பணித்துச் செயலாற்றி
மானுடத்திற்கும்
நாட்டின் முன்னேற்றத்திற்கும் எதிரான
எந்தவொரு ஆதிக்க சக்திக்கு
அடிபணியாமல்
தனிப்பட்ட வாழ்விலும் தொழில் வாழ்விலும்
சிறந்த வெளிப்படைத் தன்மையுடனும்
பொறுப்புணர்வுடனும்
அர்ப்பணிப்புக் கண்ணோட்டத்துடனும்
ஊழலற்ற சிறந்த இலங்கையராக
வாழ்வேன் எனவும் சேவையாற்றுவேன்
எனவும்
திடசங்கற்பம் பூண்டு
உறுதிமொழி பகர்கின்றேன்.

අත්සන :

නම :

දිනය :

## නාමයෝජනා පත්‍රය

01. නාමයෝජනාවට පාත්‍රවන පුද්ගලයාගේ / සංවිධානයේ නම ඃ

02. නාමයෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයාගේ / සංවිධානයේ නම, ලිපිනය, දුරකථන අංකය ආදී තොරතුරු

03. අදාළ නාමයෝජිතයා සම්මානයට පාත්‍රවීම සුදුසුයැයි තහවුරු කරන හේතු කාරණා *(කරුණාකර නාමයෝජනා මාර්ගෝපදේශයන්හි අංක 4 (ii) බලන්න)*

**ඔබ විසින් සකස් කරනු ලබන සටහන පහත කරුණුවලට අනුරූපීව සකස් කළ යුතුය.**

i. උද්ගත වූ දූෂණ තත්ත්වයක් වළක්වා ගැනීමට කටයුතු කිරීම.

ii. අනාගතයේදී දූෂණ ඇතිවීම වැළැක්වීම පිණිස පූර්වාදර්ශයක් සැපයීම.

iii. තමාගේ තත්ත්වයට වඩා ප්‍රබල මට්ටමෙන් උද්ගතවන අභියෝගයන්ට එරෙහිව කටයුතු කිරීම.

iv. සංවිධානයක හෝ පුද්ගලයෙකුගේ ප්‍රයත්නයක් ද යන වග

v. මෙම සිද්ධිය පවත්නා ක්‍රමවේදයන් භාවිත කොට දූෂණයට විරුද්ධව ක්‍රියාත්මකවීමක් ද නැතහොත් නව්‍ය ප්‍රයත්නයක්ද?

vi. එම ක්‍රියාව / ප්‍රයත්නය පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් වඩාත් බලපාන ලද්දේ කුමන ක්ෂේත්‍රයටද?

   a. සංවිධානයට
   b. ප්‍රාදේශීය ප්‍රජාවට
   c. ජාතික තලයට
   d. ජාත්‍යාන්තර තලයට

vii. මෙම නාමයෝජනාව ස්වකීය වගකීම් / රාජකාරී රාමුවෙන් ඔබ්බට ගොස් කටයුතු කරන ලද පුද්ගලයෙකු පිළිබඳවද?

viii. එසේත් නැතිනම් තමා දරණ තත්ත්වය / වෘත්තීය උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගෙන අදාළ ක්‍රියාව සිදු කළ අයෙක් පිළිබඳවද?

ix. මේ සම්බන්ධයෙන් අදාළ පුද්ගලයාට යම් ආර්ථික / පුද්ගලික / භෞතික / සමාජමය / වෘත්තීමය කැපකිරීමක් කිරීමට සිදු වුණිද?

x. එම ක්‍රියාව මගින් යහපරිචයක් හෝ ප්‍රමිතියක් / සම්මතයක් / සුවිශේෂී සන්ධිස්ථානයක් නිර්මාණය කරනු ලබන්නේද?

04. අදාළ පුද්ගලයා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ජාතික සුපිළිපන් ප්‍රණාම හෝ වෙනත් සම්මානයකට මීට පෙර තෝරාගෙන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු

05. කරුණාකර මතු සඳහන් කරුණු හෙළිදරව් කරන්න

- අදුල පුද්ගලයා / සංවිධානය අධිකරණයක් මගින් අපරාධ වරදකට හෝ ස්වකීය සුපිළිපන්නතාවයකට බලපාන ආකාරයේ ව්‍යවස්ථාපිත වරදකට වැරදිකරු වී තිබේද?
- අදුල පුද්ගලයාට / සංවිධානයට විරුද්ධව දූනට විභාග වෙමින් පවත්නා නඩු කටයුතු (අපරාධ) හෝ විනය චෝදනා පවතීද ?
- එවැනි තත්වයන් ඇත්නම් අදුල තොරතුරු සඳහන් කරන්න

**සම්මාන ප්‍රදානයට සම්බන්ධ ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ හිමිකම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සතුවන අතර සම්මාන ප්‍රදාන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.**

## නාමයෝජනාව සඳහන් ලිපිගොනුවෙහි අනුපිළිවෙල

- නාමයෝජනා පත්‍රය
- නාමයෝජනාවට ලක්වන පුද්ගලයාගේ/සංවිධානයේ සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් *(කරුණාකර නාමයෝජනා මාර්ගෝපදේශ සටහන් 4 (i) බලන්න)*
- නාමයෝජනාව ඉදිරිපත් කිරීමට හේතුව - නාමයෝජනා පත්‍රයෙහි අංක 3ට අදාළව ඉදිරිපත් කරනු ලබන විස්තරය (කරුණාකර නාමයෝජනා මාර්ගෝපදේශ සටහනේ 4 (ii) බලන්න.)
- නාමයෝජනාට ලක්වන පුද්ගලයාගේ / සංවිධානයේ කැමැත්ත සඳහන් ලිපියක් (කරුණාකර නාමයෝජනා මාර්ගෝපදේශ සටහනේ 4 (iii) බලන්න.)

නාමයෝජනාවට ලක්වන පුද්ගලයා මියගොස් සිටීනම්, පවුලේ ආසන්නතම ඥාතියෙකුට හෝ එවැනි පුද්ගලයෙකු නොමැති විටකදී වෙනත් ඥාතියෙකුටද කැමැත්ත ලබාදිය හැකිය.

**අතිරේක තොරතුරු**

- පුවත්පත් වාර්තා
- අතිරේක පසුබිම් තොරතුරු
- රූපවාහිනී / ගුවන් විදුලි වැඩසටහන් වාර්තා
- වෙනත් අදුල ලේඛන හෝ වාර්තා
- ඥාතීන් නොවන විමසුම් කළ හැකි අය